"සඳුන් පලු තනවා හිම වන පෙතින් එනවා"

හිම, චන්දන, සඳන යන නම් වලින් හැඳින්වෙන සඳුන් දෙවර්ගයකි. රත් හඳුන් හා සුදු හඳුන් ඒ දෙකයි. හඳුන් ගස ලංකාවේ සුලබ නැත. එහෙත් ඇතැම් වන පෙදෙස් වල සුදු හඳුන් ගස් කලාතුරකින් දක්නා ලැබේ. රත් හඳුන් ගස් ඉතාම විරලය.

ජය ශ්‍රී මහා බෝධි දකුණු ශාඛාව අනුරාධපුර මහ මෙවුනා උයනේ රෝපනය කිරීමෙන් පසු එහි හටගත් අෂ්ට ඵල වලින් උපන් මහා බෝධියක් චන්දන ග්‍රාමයේ රෝපනය කළබව වංශ කථා වල සඳහන් වේ. චන්දන, සඳුන්, චන්දනී ආදී නම්වලින් ඇතැම් පුද්ගලයෝද හැඳින්වෙති.

දෙවියන් යකුන් පිදීමේදී සඳුන් සුණු යොදා ගැනේ. සඳුන් අරටු වලින් සමහර පැරණි ශිල්පීහු ප්‍රතිමා තෙළුහ. ඇතැම් විට පුස- "කොළ පොත් වල පිටට යෙදූ පොත් කම්බ සඳහා සඳුන් ලී පතුරු යොදා ගෙන ඇත. ධාතූන් වහන්සේලා තැන්පත් කෙරෙන ධාතු කරඬු සඳුන් අරටු වලින් තැනූ අවස්ථාද ඇත. රත් රුවන් වැනි වටිනා වස්තු දමා තැබීම සඳහා තැනූ හෙප්පු වැනි දෑ සඳුන් අරටු වලින් තනා තුබුණු බව දැක ඇත. අටවැනි සිය වසදී දෙවුන්දර වෙරළට පාවී ආ රත් හඳුන් හරයකින් නිර්මිත උපුල්වන් දෙවිරුවක් දෙවුනුවර දෙවොලේ තැන්පත් කළ බවද සඳහන් වේ.

සිරුර සුවඳවන් කිරීමත් සිසිල් සුවයත් සඳහා සිරුරේ සඳුන් කල්ක අලේප කිරීමට පෙරදිග කාන්තාවෝ යුහුසුළු වූහ. ආයුර්වේද ඖෂධ සංයෝග සඳහා සඳුන් දෙවර්ගයම යොදා ගැනේ. බොහෝවිට ඔසු සඳහා සඳුන් ගනු ලබන්නේ සඳුන් අරටුවයි. සුවඳ හමන්නේද සඳුන් අරටු වලිනි. ළඳරුවන් සඳහා නිතර භාවිතා වන රත කල්කය අඹරා ගැනීමේදී දෙහිම හෙවත් රත් හඳුන් සුදු හඳුන් දෙක යොදා ගැනේ. තද හිසේ ඇඹිම සුව කරන්නට සුදු හඳුන් අඹල් දියෙන් ගලගා හළඹේ පැළැස්තරයක් එළීමට අපි පුරුදු වී සිටිමු. තැලීම් වැනි ආපදාවකදී සිරුරේ ඉදිමීමක් ඇති උවවහොත් රත් හඳුන් දෙහි ඇඹුලෙන් ගලගා ගෑමට අපි පුරුදු වී සිටිමු. ඇස්රෝග වලදී ඇස් වටා ආලේප කරන බෙහෙත් සඳහා සඳුන් දෙවර්ගයම යොදා ගැනේ බොහෝ තල් වර්ග සිදීමේදී අයුර්වේද වෛද්‍යවරු කල්ක, කසාය ආදියට සඳුන් භාවිතා කරති. උණ සමනය කිරීමට දෙනු ලබන කසාය සඳහාද බොහෝවිට සඳුන් යොදා ගැනේ. සුදු හඳුන් ගළගා ගිතෙල් හා කිතුල් හකුරු මුසු කොට බොන්නට දීමෙන් පොළොන් විෂ සමනය වෙයි. හෝම කර්ම වලදී සුවඳ දුම් පිළියෙල කිරීම සඳහාද සඳුන් සුණු භාවිතා වේ. වැඩි වියට පත් යුවතිය මුලින්ම නැහැවීමට ගන්නා ජලයට සඳුන් මුසු කෙරේ. උසස් පුද්ගලයන්ගේ මිහිදමන දර සෑයටද සඳුන් අරටු දමනු ලැබේ. අග්නි පූජාවේදී පෙර බමුණන් හෝම ගින්න දැල්වූයේ හඳුන් අරටු ඇතිවය.

විශ්‍රාමලත් විදුහල්පති
ශාස්ත්‍රවේදී
නා.ලි. සාර්ලිස් අමරසිරි

අපේ සාහිත්‍ය කරුවනට ද සඳුන් අමතක වී නැත.

"හැමි වසත් රජ - කල් සඟළා
දකුණු මරු
ගැවැසී මල ගලැ සඳුන් - තුරැහි
පියුම් රොන් හී"

"සසදාවත"

වසන්ත රජයාගේ යහළු දකුණු සුළඟ මලය පර්වතයේ සඳුන් ගස් වලත් හදින් ගේ පියුම් රේණු වලත් ඇසුරෙන් හැමීය.

"සුවඳ සඳුන් කොකුසඟරා
පැහැද තමන් වෙර තමරා"

යනුවෙන් ගුත්තිලයේද සඳුන් කල්කය සිරුරේ ආලේප කළ බව කියැවේ.

සමාජයේ දුදන ගති හෙළි කරන අලගියවන්නයෝ සුභාෂිතයේ මෙසේ කියති.

"සඳුන් කපුරු පිහිදිය සමගින් නොමද
සොඳින් කලල් කෙරෙමින් සුවඳ මුවමද
නිතින් හෙමඹ ඉස ඉස ලුහුණු මැවිවෙද
තමන් ගුණය නොහරින වැනි දුදන හද"

අන්තර්ජාලයෙන් සන්නස
www.sannasa.net හෝ
www.sannasa.com

සාහිත්‍ය විවේචනයේ කෙටි මං සොයන්නෝ

මා කළ දිගම පරිවර්තනය හමාර කළ විටත් එය මුද්‍රණයෙන් නිකුත් වූ විටත් මම බෙහෙවින් සතුටු වීමි.

සිරිත් පරිදි මා විසින් පිරිනමන ලද කාණ්ඩ හතෙන් සමන්විත "අර්බත් දරුවෝ" ද සහ පහළොස් දෙනකුට තුටු පඬුරු වශයෙන් පිරිනමන ලදී.

ඔවුනතුරින් මට සහතික කොට කිව හැකි තුන් දෙනෙක් පමණක් පොත් හත ම කියවා නිම කළහ. දෙදෙනෙක් කාන්තාවෝය. දෙන්නාම කුරුණෑගලින් ආවෝ ය. හේමමාලා හේරත් හැරුණු විට අනෙක් කාන්තාව විශ්‍රාම ලත් අධ්‍යාපන අධ්‍යක්ෂවරියකි. ඇය කියවූයේ ජර්ත් නුවරට ආ විට මගේ මිත්‍ර චන්ද්‍ර හේවගේ ගෙන් ලැබුණු පිටපත් ය. තුන්වැනි පාඨකයා චන්ද්‍රා හේවගේ ය.

ඔය තුන් දෙනා හැරුණු විට මගේ හැම පොතක්ම මුද්‍රණයටත් පෙර කියවන මගේ ශ්‍රී ලංකා මිත්‍ර හිමල් දිසානායකත් මමත් කියවීම හමාර කොට ඇත්තෙමු.

මට නම් යථාර්ථය නැවතත් සිහිපත් කරන්නට සිදුවූයේ හිමල් දිසානායකගෙන් (තෑගි වශයෙන්) පොත් තුනම ලබා ගත් ශ්‍රී ලාංකික ලේඛකයකුගේ ප්‍රතිචාරය ඇසූ විට ය.

"මේ ඔක්කොම කියවන්නේ කොහොමද.."

හිමල් ඔහුට පොත් දුන්නේ ඉල්ලලපු හින්දා ය. බලෙන් ඇගේ ගැහුවා නොවේ. ඉල්ලුවේ මා ගැන සඟරාවකට ලිපියක් ලිවීම සඳහා ය.



සම්මානලාභී නවකතාකරුවකු හා නිතිපතා පුවත්පත්වලට ලිපි ලියන්නකු ද වූ මේ පුද්ගලයා මා මුණ ගැසෙන්නටම ආවේ ය. ඒ වෙලාවේදීත් ඔය අදහස දළ වශයෙන් මට දැනුම් දුන්නේ ය. පොත් දීමට කලින් පවා ඔහු මගේ මිතුරා සමග කතා කොට මා ගැන විස්තර දැනගන්නට තැත් කොට ඇත. මා හමුවූ විට මට දැනගන්නට හැකි වූ එක් දෙයක් නම් මගේ පරිවර්තනයක් වන "හෝවිමිංගේ හිරුගෙයි දිනපොත" ගැන ඔහු දැන සිටි බව ය. එය කියවන්නටත් ඇත. "අර්බත් දරුවෝ" ගැන හම් අසා තිබුණා විතර ය. මා ලියූ වෙනත් එබඳු පොතක් කියවීඹ තබා නමෙන් වත් දැන සිටි බවක් මට නොපෙනිනි.

නම කියන එක හරි නැත. මේ ලේඛකයා අනෙක් පත්තරකාරයන් වාගේම විවේචනයේ කෙටි මං සොයන්නකු බව මට පෙනී ගියේ යට කී ප්‍රතිචාරය නිසා ය.

මෙරට පත්තරවලට ලියන අපේ ලේඛකයන් ගැන හරි හැටි කියන්නට මම සමත් නොවෙමි. බෙහෝ දෙනා පොතක් නොකියවා නම් නොලියන බව කෙළින්ම කිව යුතුය. ශ්‍රී ලංකාවේ පත්තරකාරයන්ට තියෙන හදිස්සිය ඔවුන්ට නැත. ඔවුන්ට ඇති ප්‍රශ්නය තමා කමතේ ලේඛකයකුගේ පොතක් අල්ලාගෙන ලිවීම පමණි. පොදුවේ පළවන පොත පත දිහා බලා ලියන ලිවීමක් නොවේ. මගෙන් තෑගි වශයෙන් පොත් ලැබූ අය පවා මේ චෝදනාවෙන් ගැලවෙන්නේ නැත.

දැනට හරියටම වසර දහයකට උඩ දී ශ්‍රී ලංකාවේ මුල් ගණයට අයත් පුවත්පතක දක්ෂ විචාරකයකු මා සමග පැවැත්වූ සාකච්ඡාවක් මට අමතක නොවන්නේ ය. පත්තර කන්තෝරුවේදී විශේෂාංග කතුවරිය මා සමග පැවසුවේ ඒ කියන තරුණයා මා හමුවන්නට එනවා ඇත කියා ය. නැත. මට දුරකතන ඇමතුමක් දුන් ඔහු මට කන්තෝරුවට එන්නැයි කීවේ ය. මමත් මගේ වැඩය කරවා ගනු පිණිස කියාපු වෙලාවට ගොස් ඔහු ඉදිරියේ පෙනී සිටියෙමි. පසය බාගයකටත් වඩා වේලාවක් මා සමග කතා කොට විස්තර සටහන් කරගත් මේ විවේචකයා ළඟ ඒ වන විටත් මා දුන් පොත් හතර හෝ පහ තිබෙනවා මම දුටුවෙමි. ඒ තියා ඒවා පෙන්වමින් මම ඒ පොත් කියවා ලියන්නැයි ඒ වෙලාවේ ඔහුගෙන් ඉල්ලා සිටියෙමි.

පත්තරයේ මා ගැන පිටු බාගයක ලිපියක් පළ විය.

ලිපිය ඇත්තෙන්ම මා ගැනය. මේ තරුණ විවේචකයා කොතරම් දක්ෂ විවේචකයකුදැයි කිව්හොත් මගේ පොතක නමක් පවා නොලියා මා ගැන ලිපියක් ලිවීම ඔහුට පහසු කාරියක් විය.

ඒ වාරයේම මම ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ වැඩ සටහන් දෙකක් බාරව ක්‍රියා කරන දෙදෙනකුටද මගේ පොත් පිළිගන්වා පොත් ගැන විවේචනයක් ප්‍රචාරය කරවා ගන්නට බැලුවෙමි. ඒ දෙකම පත්තරයේ විජ්ජාවට වඩා සාර්ථක වූ බව කෙළින්ම කිව යුතු ය. එක් විවේචකයකුට පොත් පිළිගැන්වූයේ මා සමග පිළිසඳර අරඹන්නට ඔන්න මෙන්න කියා ය. එහෙත් පොත් දීපු වේලාව ප්‍රශ්නයක් වූයේ නැත. කලින් පොත් ලබාගත් විවේචකයා ඒ පොත් දිහා බැලුවේ ද මා සමග කතාව පටන්ගන්නාට පස්සේ ය.

එකක් කිව යුතුය. එහෙන් මෙහෙන් බලා පුවත් මා ගැන පමණක් නොව පොත් ගැනත් ශ්‍රාවක කුතූහලය දනවන ආකාරයේ ප්‍රශ්න අසමින් උචිත ප්‍රතිචාර උකහා ගැනීමට ඒ දෙදෙනාම සමත්වූවෝ ය.

මට මතක් වූයේ මේ රටේ රූපවාහිනියෙන් පොත් පත් විවේචනය කරන විචාරකයන් ගන්නා මහන්සියයි. ඔවුන් පොත් කියවා ලකුණු කරගත් තැන් උපුටා දක්වමින් කතුවරුන් හෙල්ලුම් කවන විදියේ ප්‍රශ්න මතුකරනවා මා දැක ඇත. ඔවුන් අසන ප්‍රශ්න අද ශ්‍රී ලංකා ගුවන් විදුලියේ විචාරකයන් අසන විදියේ ඇඟ බේරා ගන්නා ප්‍රශ්න නොවේ. පොතක ගැඹුරටම කිමිඳ මතු කරන වැදගත් හා අමාරු ප්‍රශ්න ය. ගැටලු ය. ශ්‍රාවකයාට පොතේ අඟය වටහා ගත හැකි වන විදියේ විමසීම් ය. විවේචනයට සවන්දීම පවා පොත ගැන සැළකිය යුතු අවබෝධයක් ලද හැකි ව්‍යායාමයක් වන්නේ ය.

ශ්‍රී ලංකාවේ පත්තරකාරයන් පොතක් ගැන ලිවීමේ දී කතුවරයා අල්ලාගෙන ඔහු කියන දේත් ඒ හැටියට ම පළ කිරීමෙන් තමාගේ වගකීම ඉටුකරන්නට හෝ අත්තම කියනොත් මගහරින්නට පුරුදුව සිටීම ශ්‍රී ලාංකික සාහිත්‍ය විචාරයේ ප්‍රබල ලක්ෂණයක් ව ඇති බව නම් කිව යුතුය.

මා දකින ආකාරයට නම් ඒ ප්‍රතිපත්තිය නොහොත් ක්‍රියාමාර්ගය සාහිත්‍ය වර්ධනයට නොව අඩ පය ගැසීමට මං සැළසීමකි.

මා මෙහිලා සැළකිල්ලට නොගත් වැදගත් කරුණක් ඇත . එනම් පත්තරකාරයකු වූ පමණින් හෝ ගත්කතුවරයකු වූ පමණින් හෝ ලේඛකයකු විචාරකයකු නොවන බව ය. ඒ තැනට එන්නට ඔහු සතු විය යුතු හැකියා සහ ගුණාංග ද ඇත . හුදු ලිවීම පමණක් නොව තමා අත ගසන විෂය පිළිබඳ සැළකිය යුතු අවබෝධයක් ඔහුට තිබිය යුතු ය. ආචාරධර්ම හා මග හළ යුතු දුබලතා ද දත යුතු ය. ඒ සියල්ලටම වඩා විචාරකයා සතුව තිබිය යුතු ගුණාංගයක් නම් ඔහුගේ විවේක බුද්ධියයි. එයින් අදහස් වන විවේකය වූ කලි අක්‍රිය වීමක් නොවේ. අගතිය හා ආවේගය යන දෙකෙන්ම විශ්‍රාම ගෙන නොහොත් දුරස් වී කරුණු සළකා බැලීමේ හැකියාවය.

ඒ නැති තැන විවේචනයක් තිබීම අපහසු ය. ■